# කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය, වැලිගත්ත, හම්බන්තොට

# පුරප්පාඩු

# (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා පමණි)

මෙම ආයතනයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වල දැනට **ස්ථිර සේවයේ නියුතු, තනතුරෙහි තහවුරු කරන ලද සේවක භවතුන්ගෙන් පමණක්** අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කළ අයදුම්පත් තමා සේවය කරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ/විශ්වවිද්‍යාලයේ/මණ්ඩපයේ/ආයතනයේ ලේකම්/ ලේඛකාධිකාරි/මණ්ඩපාධිපති/අධ්‍යක්ෂ මගින් 2026.06.26 දින හෝ එදිනට පෙර "නියෝජ්‍ය ලේඛකාධිකාරි, කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂිතාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය, වැලිගත්ත, හම්බන්තොට" වෙත ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන්නට සැලැස්විය යුතුය. අසම්පූර්ණ, අපැහැදිලි හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර එසේ ප්‍රතික්ෂේප වූ අයදුම්පත් කුමන හේතුවක් නිසාවත් නැවත සළකා බලනු නොලැබේ.

අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට පහත දැක්වෙන ඒ ඒ තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද ලබා තිබිය යුතු අතර, එම සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කිරීම සඳහා අදාල සහතික වල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා එවනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

### 01. ක්ෂේත්‍ර පරිපාලක (III ශ්‍රේණිය)

**අවශ්‍ය සුදුසුකම් :**

i) (අ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන සාමාර්ථයන් පහක් (05) සහිතව විෂයන් 6කින් සමත්ව තිබීම. සම්මාන සාමාර්ථයන් ලබාගත් විෂයන් අතරට කෘෂිකර්මය හා ගණිතය යන විෂයන් ඇතුලත් විය යුතුය.

හෝ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක සේවය කරන, අවම වශයෙන් 8 වන ශ්‍රේණිය සමත්ව ඇති සහ පිළිගත් ගොවිපළක ක්ෂේත්‍ර අධීක්ෂණ කටයුතු පිළිබඳ වසර අටක (08) නොඅඩු පළපුරුද්දක් ඇති සේවකයෙකු විය යුතුය

**වැටුප් ක්‍රමය** : U MT 1 (III) - Rs. 51,095-7x540;10x640-60,575 p.m.
**බඳවා ගැනීම :** අභියෝගාතා පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

### 02. තනතුර:- ට්‍රැක්ටර් ක්‍රියාකරු (III ශ්‍රේණිය)

**අවශ්‍ය සුදුසුකම් :**

1. ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම සහ අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සමාර්ථ (C) දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම සහ තනතුරට අදාළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් N.V.Q. 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. පාඨමාලාවට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (N.V.Q. Level) තහවුරු කිරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (Tertiary and Vocational Education Commission) මගින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කළ යුතුය.

හෝ

2. ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම සහ අ.පො.ස.(සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ කාර්මික කුසලතා සමඟ වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

3. ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා තනතුරට අදාළ ක්ෂේත්‍රයේ කාර්මික කුසලතා සමඟ අවම වශයෙන් වසර පහක (05) සේවා පළපුරුද්දක් තිබීම.

**වැටුප් ක්‍රමය :** U PL 2 (III) - Rs. 44,575-16x490-52,415 p.m.
**බඳවා ගැනීම :**වෘත්තීය පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

(ඉහත වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025 සහ 02/2025 (i) අනුව වැටුප් පරිමාණය වේ. මූලික වැටුපට අමතරව රජය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**සැලකිය යුතුයි :-**

**ඉහත තනතුරුවලට බඳවා ගැනීමේ දී වැටුප් පිහිටුවනු ලබන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහය 2023 හි VI වන පරිච්ඡේදයේ 6.5 හා 26 උප වගන්තිය අනුව වේ.**

අධ්‍යක්ෂ
කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය
වැලිගත්ත නවනගරය, හම්බන්තොට
2026.06.11